පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
**Police Media Division**

තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No — 517

ෆැක්ස් / தொலை நகல் / Fax — 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail — dir.media@police.lk

මගේ අංකය / எனது இல / My No — 539 / 2022

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — 2022.04.05 පැය 2150

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් විශේෂ කාර්ය බලකායේ ආරක්ෂාව සහිතව කොළඹ වරායේ නතරකර තිබූ කන්ටේනර් රථයක් පිළිබඳව.**

පොලිස් විශේෂ කාර්ය බලකායේ ආරක්ෂාව සහිතව කොළඹ වරායේ නතරකර තිබූ කන්ටේනර් රථයක් පිලිබඳව ප්‍රධාන මාධ්‍ය වල සහ වෙනත් සමාජ මාධ්‍ය වල ව්‍යාජ තොරතුරක් මේ වන විට ප්‍රචාරය වෙමින් පවතී.

එම කන්ටේනර් රථය බියගම පෞද්ගලික ආයතනයක සිට කොළඹ වරාය වෙතට විකිරණශීලි ප්‍රභවයක් ප්‍රවාහනය කරන ලද කන්ටේනර් රථයක් වන අතර, මෙම විකිරණශීලි ප්‍රභවයන් විවිධ අවශ්‍යතාවයන් සඳහා රට තුල ප්‍රවාහනය කිරීමේදී 1984 අංක 40 දරණ පරමාණු බලශක්ති පනතට අනුව නියමිත බලධාරියෙකු විසින් පොලිස් ආරක්ෂාව ඉල්ලා සිටින අවස්ථාවකදී එම ආරක්ෂාව ලබාදීම පොලීසිය විසින් කටයුතු කරනු ඇත.

මෙම විකිරණශීලි ප්‍රභව ප්‍රවාහනය කිරීමේදී පොලීසිය රජයේ ගාස්තු අයකර ගැනීමකින් පසුව අදාල ආරක්ෂව ලබාදී ඇති අතර ඉහත ආරක්ෂාව සම්බන්ධයෙන් පොලිස් විශේෂ කාර්ය බලකායත් මාර්ගයේ රථවාහන පාලනය සඳහා යතුරුපැදි ලබාදීම පොලිස් රථවාහන මූලස්ථානය මගිනුත් සිදුකර ඇත. එසේම විකිරණශීලි ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේදී පරමාණු බලශක්ති අධිකාරියේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ප්‍රවාහනය කරනු ලබන අතර ගමන් ආරම්භයේ සිට ගමනාන්තය දක්වා ඉතා සුරක්ෂිතව ප්‍රවාහනය කෙරෙනු ඇත.

ඊයේ දින බියගම පිහිටි පුද්ගලික ආයතනයක සිට කොළඹ වරාය වෙත රැගෙන ආ එම කන්ටේනර් රථය වරාය තුළ ආරක්ෂාව සහිතව නතර කර තිබෙන අවස්ථාවකදී යම් පුද්ගලයෙකු විසින් ලබාගත් වීඩියෝ දර්ශනයක් වැරදි අර්ථකතනයක් දෙමින් සමාජ මාධ්‍ය වෙත යොමුකර ඇති බවට නිරීක්ෂණය වන අතර එය දැනට ප්‍රචාරය වෙමින් පවතී.

එම පුවත නිවැරදි කිරීම සඳහා මෙම මාධ්‍ය නිවේදනය නිකුත් කරන ලදී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**